(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 2(4).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන

# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2025 ජූනි 06 සිකුරාදා**

**2025 ජූනි 17 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සේවකයන්ගේ අයවැය සහන දීමනාව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සේවකයන්ගේ අයවැය සහන දීමනා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 මාර්තු 27 දිනැති අංක 2429/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.06.03 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 1),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 අප්‍රේල් 29 දිනැති අංක 2434/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.06.03 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 2),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 මැයි 05 දිනැති අංක 2435/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.06.03 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා,— ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යටතේ නියෝග,— 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 3 වගන්තිය සමඟ කියවිය යුතු 34 වගන්තිය යටතේ තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 අප්‍රේල් 03 දිනැති අංක 2430/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.06.03 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත යටතේ නියමයන්,— 2024 අංක 49 දරන විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනතේ 2(1) වගන්තිය යටතේ සහ 1(2) වගන්තිය යටතේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 මාර්තු 28 දිනැති අංක 2429/51 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.06.03 දින ඉදිරිපත් කරන ලද නියමයන් අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

---

**2025 ජූනි 19 බ්‍රහස්පතින්දා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

---

**2025 ජූලි 08 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

496/2025

ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ විකාශය වන ලාංකීය රූපවාහිනී නාලිකා සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, රජයේ රූපවාහිනී නාලිකා හා පෞද්ගලික රූපවාහිනී නාලිකා ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) රජයේ හා පෞද්ගලික රූපවාහිනී නාලිකා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ජනමාධ්‍ය සඳහා ආචාර ධර්ම පද්ධතියක් පැවතිය යුතු බව පිළිගන්නේද;

(ii) එම ආචාර ධර්ම පද්ධතිය, ශ්‍රී ලාංකීය රූපවාහිනී නාලිකා සම්බන්ධයෙන් බලපැවැත්වෙන ආකාරය කෙසේද;

(iii) රූපවාහිනී නාලිකාවල මේ වනවිට විකාශය කරනු ලබන වැඩසටහන් සම්බන්ධයෙන් අවධානය යොමු කර ඇති ආකාරය කෙසේද;

(iv) එම වැඩසටහන් සම්බන්ධයෙන් විමර්ශනාත්මක වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(v) එසේ නම්, එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරනු ලබන ආකාරය කෙසේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

516/2025

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වත්මන් ජනාධිපතිවරයා පත්වීමෙන් පසුව අපරාධ හතකට අදාළව නවතා දමා තිබූ විමර්ශන නැවත ආරම්භ කරන ලද බව ජනාධිපතිවරයා විසින් ප්‍රකාශ කරන ලද බව දන්නේද;

(ii) 2011 වර්ෂයේදී යාපනය ප්‍රදේශයේදී අතුරුදහන් කිරීමට ලක් වූ 'ලලිත් වීරරාජ් සහ කුගන් මුරුගානන්දන්' යන දේශපාලන ක්‍රියාකාරීන් දෙදෙනාගේ අතුරුදහන් කිරීමට අදාළ විමර්ශනයේ වර්තමාන ප්‍රගතිය කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ උතුරු-නැගෙනහිර ප්‍රදේශවල පැවති සිවිල් යුද්මය තත්ත්වය අවසන් වීමෙන් පසු සිදු වූ, එහෙත් මේ වනතෙක් විසඳා නොමැති අනෙකුත් අතුරුදහන් කිරීම් කිසිවකට හෝ අදාළ විමර්ශන කටයුතු මේ වනවිට අවසන් කර තිබේද;

(iv) එම අතුරුදහන් කිරීම්වලට අදාළ විමර්ශන කටයුතු ප්‍රමාද වීමට දේශපාලන මැදිහත්වීම් හේතු වී තිබේද;

(v) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

725/2025

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඇති පීඨවල මේ වනවිට ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව එක් එක් පීඨය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම විශ්වවිද්‍යාලයේ මේ වනවිට නවකවදය ඉතා උග්‍ර ලෙස ක්‍රියාත්මක වන බව දන්නේද;

(iii) එසේ නම්, එම තත්ත්වය පාලනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

793/2025

ගරු සුජීව දිසානායක මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල, දැදුරු ඔය ජලාශ ව්‍යාපෘතියට සමගාමීව ආරම්භ කරන ලද පානීය ජල ව්‍යාපෘතියෙන් ආවරණය කරනු ලබන ග්‍රාම නිලධාරි වසම් කවරේද;

(ii) එම ග්‍රාම නිලධාරි වසම් අතරින් ව්‍යාපෘතියට අදාළ වැඩ අවසන් කර ඇති ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව සහ වැඩ අවසන් කර නොමැති ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වැඩ අවසන් කර නොමැති ග්‍රාම නිලධාරි වසම්වල වැඩ අවසන් කිරීමට ඇති බාධා කවරේද;

(iv) වැඩ අවසන් කර නොමැති ග්‍රාම නිලධාරි වසම්වල වැඩ අවසන් කිරීමට ගත වන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

845/2025

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු මැද පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇති අනුරාධපුර දිස්ත්‍රික්කයේ සීමාසහිත විවිධ සේවා සමූපකාර සමිති සංඛ්‍යාව, බැංකු සමිති සංඛ්‍යාව සහ එම බැංකුවල ශාඛා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම සමූපකාර සමිති සහ බැංකු සමිති ස්ථාපිත කිරීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සීමාසහිත උතුරු මැද පළාත් සෞභාග්‍යා සමූපකාර සමිතිය (SCD) සහ සීමාසහිත අනුරාධපුර දිස්ත්‍රික් ග්‍රාමීය මූල්‍යාධන සංවර්ධන සමූපකාර සමිතිය (RCD) යනුවෙන් සමිති දෙකක් ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම එක් එක් සමිතිය ආරම්භ කරන ලද දිනය, ලියාපදිංචි අංකය සහ ලිපිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ලිපිනවල වර්තමාන අයිතිකරුවන් කවරේද;

(iv) එම සමිති ස්ථාපිත කිරීමේදී ප්‍රාථමික, ද්විතීයික සහ තෘතීය සංයුතිය සහ ක්‍රමවේදය අනුගමනය කර තිබේද;

(v) නොඑසේ නම්, අනුගමනය කර ඇති ක්‍රමවේදය කවරේද;

(vi) එම සමිති සඳහා සේවකයන් බඳවා ගැනීමේදී උතුරු මැද පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාවේ අනුමතිය ලබා ගෙන තිබේද;

(vii) නොඑසේ නම්, ඔවුන් බඳවා ගන්නා ලද ක්‍රමවේදය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

849/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පෞද්ගලික ඉඩමක් කැබැලි කර අලෙවි කිරීමේදී එම ඉඩමෙන් යම් භූමි ප්‍රමාණයක් පොදු ඉඩමක් ලෙස භාවිතයට ගැනීම සඳහා අදාළ ප්‍රාදේශීය සභාවට භාර දිය යුතු බවත්;

(ii) අදාළ ප්‍රාදේශීය සභාව විසින් එම පොදු ඉඩම, පදිංචිකරුවන්ගේ පොදු අවශ්‍යතාවයන් වෙනුවෙන් වෙන් කළ යුතු බවත්;

(iii) කිසිදු හේතුවක් මත, පොදු ඉඩම් කොටස් පෞද්ගලික පරිහරණය සඳහා වෙන් කළ නොහැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව සතු පොදු ඉඩම් සංඛ්‍යාව සහ එම එක් එක් ඉඩමේ විශාලත්වය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව සතු පොදු ඉඩම් මේ වනවිට සමහර පුද්ගලයන් විසින් පෞද්ගලික පරිහරණයට යොදා ගෙන ඇති බව දන්නේද;

(iii) එම පුද්ගලයින්ගේ නම් ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(iv) ඔවුන්ට එරෙහිව ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

(v) නිල්පනාගොඩ ග්‍රාම නිලධාරි වසමේ 'අඹ සෙවන වත්ත' ඉඩමට අයත් පොදු ඉඩමේ ප්‍රාදේශීය දේශපාලඥයකුගේ සහෝදරයකු විසින් අනවසර ඉදිකිරීම් සහ ගොඩකිරීම් සිදු කර තිබේද;

(vi) එසේ නම්, ඔහුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

865/2025

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තේ නිෂ්පාදනයේදී, ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තශාලාවල කසල තේ/ ප්‍රතිසැකසුම් තේ නිෂ්පාදනය වන බවත්;

(ii) එම කසල තේ, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ බලපත්‍රයක් මත කර්මාන්තශාලාවෙන් බැහැර කිරීමට අවසර ලබා දෙන බවත්;

(iii) නමුත්, එම බැහැර කිරීමේ ක්‍රියාවලිය 100% ක්ම නීත්‍යානුකූලව සිදු නොවන බවත්;

(iv) එම කසල තේ, CTC තේ නිෂ්පාදන කර්මාන්තශාලා තුළ නිෂ්පාදනය කරනු ලබන තේ බවට නම් කර, කොළඹ තේ වෙන්දේසියේ විකුණන බවත්;

(v) එම කසල තේ නීත්‍යානුකූල නොවන මාර්ග ඔස්සේ අපනයනය කරනු ලබන බවත්;

(vi) එම තත්ත්වය ප්‍රමිතියෙන් යුතු තේ නිෂ්පාදනයට බාධාවක් වන අතර 'Ceylon Tea' කීර්තිනාමයට හානියක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, කසල තේ සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි පියවර කවරේද;

(ii) කසල තේ අපනයනය තහනම් කිරීමට පියවර ගන්නේද;

(iii) නොඑසේ නම්, කසල තේ අපනයනය ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අධීක්ෂණය යටතේ සිදු කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

872/2025

ගරු නිශාන්ත පෙරේරා මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂයේ සිට 2018 දක්වා තේ නැවත වගා කිරීම සඳහා ඉලක්ක කර තිබූ ඉඩම් ප්‍රමාණය සහ තේ නැවත වගා කර ඇති ඉඩම් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් හෙක්ටයාර්වලින් කොපමණද;

(ii) තේ නැවත වගා කරන ලද ඉඩම් සඳහා පළමු වාරිකය, දෙවන වාරිකය සහ තෙවන වාරිකය ලෙස සහනාධාර මුදල් ගෙවා තිබුණේද;

(iii) එසේ නම්, එම වාරික ගෙවන ලද ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

876/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019.01.01 සිට 2025.03.31 දක්වා මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා ගැනීම සඳහා අයදුම් කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(ii) පැවති රජයේ විශේෂ වැඩසටහනක් යටතේ ඉහත කාලය තුළ එම පුද්ගලයන්ට 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා දී තිබේද;

(iii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(iv) 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා ගැනීම සඳහා අයදුම් කරන ලද පුද්ගලයන් අතරින් සමහර පුද්ගලයන්ට එම ඔප්පු ලබා දී නොමැති බව දන්නේද;

(v) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(vi) ඔවුන්ට මේ දක්වා 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

915/2025

ගරු ටී.කේ. ජයසුන්දර මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට 2024 දක්වා ගාල්ල දිස්ත්‍රික්කයේ ආරම්භ කර ඇති එක් එක් ප්‍රජා ජල ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුදල, ව්‍යාපෘතිය ආරම්භ කරන ලද දිනය, මේ වනවිට වියදම් කර ඇති මුදල, ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව, මේ වනවිට ජලය ලබා දී ඇති පවුල් සංඛ්‍යාව සහ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුගේ/කොන්ත්‍රාත් ආයතනයේ නම එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත ජල ව්‍යාපෘති අතරින් මේ වනතෙක් ජල පහසුකම් ලබා දී නොමැති ව්‍යාපෘති කවරේද;

(iii) එම ව්‍යාපෘති අසාර්ථක වීමට හේතු කවරේද;

(iv) එම එක් එක් ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය භාරව සිටි නිලධාරින්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී දූෂණ හා අක්‍රමිකතා සිදු වී තිබේ නම්, ඊට වගකිවයුතු නිලධාරින්ට එරෙහිව ක්‍රියා කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 ජූලි 09 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

614/2025

ගරු නීතිඥ චමින්ද්‍රානි කිරිඇල්ල මහත්මිය,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර ජාතික රෝහල සතු සමස්ත භූමි ප්‍රමාණය කොපමණද;

(ii) මේ වනවිට විවිධ රජයේ ආයතන හා විවිධ පුද්ගලයන් විසින් එම රෝහල සතු ඉඩම් නීති විරෝධී ලෙස අත්පත් කර ගෙන සිටින බව දන්නේද;

(iii) එම තත්ත්වය රෝහලේ ඉදිරි සංවර්ධන කටයුතුවලට බාධාවක් බව පිළිගන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

637/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ මාළු අස්වැන්න එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාලය තුළ මාළු අපනයනය කිරීමෙන් උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම කාලය තුළ ශ්‍රී ලංකාවට මාළු ආනයනය කිරීම සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ශ්‍රී ලංකාවේ මාළු අස්වැන්න ඉහළ නංවා ගැනීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

651/2025

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජා-ඇල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ රාගම-පේරලන්ද වැව තිබෙන බව දන්නේද;

(ii) එම වැව 'භූ දර්ශන ව්‍යාපෘතිය' ලෙස සංවර්ධනය කිරීම සඳහා තෝරා ගන්නා ලද දිනය කවරේද;

(iii) එම ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු කවරේද;

(iv) එම ව්‍යාපෘතිය සඳහා මේ වනවිට වැය කර ඇති මුදල කොපමණද;

(v) එම ව්‍යාපෘතිය මේ වන විට නවතා ඇති බව දන්නේද;

(vi) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

712/2025

ගරු මුජිබුර් රහුමාන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට 2019 දක්වා කාල පරිච්ඡේදයේදී සිදු වී ඇති වංචා, දූෂණ සහ සාතන සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් දේශපාලකයන්ට සහ රාජ්‍ය නිලධාරින්ට එරෙහිව 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාලය තුළ පවරා ඇති නඩු සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් මේ වනවිට නඩු කටයුතු අවසන් වී ඇති නඩු සංඛ්‍යාව කොපමණද;

(iii) එම නඩු කවරේද;

(iv) ඉහත (i)හි සඳහන් නඩු අතරින් ඉල්ලා අස්කරගෙන ඇති නඩු සංඛ්‍යාව කොපමණද;

(v) එම නඩු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

950/2025

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ, වේලනයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටුවා ඇති තැපැල් කාර්යාලය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් නොමැති බැවින් එම තැපැල් කාර්යාලය තාවකාලික ගොඩනැගිල්ලක පවත්වාගෙන යන බව දන්නේද;

(ii) එසේ නම්, ඉහත තැපැල් කාර්යාලය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීමට පියවර ගන්නේද;

(iii) එම ගොඩනැගිල්ල ඉදිකරනු ලබන කාල වකවානුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 ජූලි 11 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

14/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ හා තදාසන්න ප්‍රදේශවල වාහන තදබදය අවම කිරීම සඳහා 2015 වර්ෂයේ සිට මේ දක්වා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම ව්‍යාපෘතිවල නම් කවරේද;

(iii) එම එක් එක් ව්‍යාපෘතිය සඳහා වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ව්‍යාපෘති මේ වනවිට අසාර්ථක වී එමඟින් මුදල් නාස්තියක් සිදු වී ඇති බවට විගණන වාර්තාව මඟින් පෙන්වා දී තිබෙන බව දන්නේද;

(v) එසේ නම්, එසේ නාස්ති වී ඇති මුදල කොපමණද;

(vi) ඉහත ව්‍යාපෘති සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

114/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සිදු වූ පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා මේ දක්වා පත්කර ඇති කොමිෂන් සභා සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් කොමිෂන් සභාවට පත් කරන ලද සාමාජිකයන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් කොමිෂන් සභාව විසින් ලබා දී ඇති නිර්දේශ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා මේ දක්වා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

716/2025

ගරු ධනුෂ්ක රංගනාත් මහතා,— ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ අස්වැසුම ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව අස්වැසුම ප්‍රතිලාභීන් වර්ගීකරණය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) කළුතර දිස්ත්‍රික්කයේ අස්වැසුම ප්‍රතිලාභීන් සංඛ්‍යාව එක් එක් මැතිවරණ බලප්‍රදේශය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) අස්වැසුම ප්‍රතිලාභය ලැබිය යුතු එහෙත් මේ දක්වා එම ප්‍රතිලාභය නොලැබෙන අගලවත්ත මැතිවරණ බලප්‍රදේශයේ පදිංචි කුටුම්භයන් සම්බන්ධයෙන් දැනුම්වත් වී තිබේද;

(v) ඔවුන් සම්බන්ධයෙන් ඉදිරියේදී සහනදායී වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අඩු ආදායම්ලාභීන් තෝරා ගැනීම සඳහා සම්මත නිර්ණායකයක් තිබේද;

(ii) අස්වැසුම ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී අනුගමනය කර ඇති ක්‍රමවේදය සම්බන්ධයෙන් සෑහීමකට පත් වන්නේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

718/2025

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ ඇති සමස්ත කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) 2024/2025 මහ කන්නයේ එම දිස්ත්‍රික්කයේ සමස්ත වී අස්වැන්න කොපමණද;

(iii) වී අස්වැන්න නෙළීමට පෙර මොනරාගල දිස්ත්‍රික්කයේ සියලුම වී ගොවීන්ට පොහොර සහනාධාරය ලබා දී තිබුණේද;

(iv) එම වී අස්වැන්නෙන් වී අලෙවි මණ්ඩලය විසින් මිලට ගන්නා ලද වී ප්‍රමාණය කොපමණද;

(v) මොනරාගල දිස්ත්‍රික්කයේ ඇති රජයේ වී ගබඩා සංඛ්‍යාව, එම එක් එක් ගබඩාවේ ලිපිනය හා ගබඩා ධාරිතාවය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

919/2025

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ — මඩකලපුව රාත්‍රී තැපැල් දුම්රිය තුළ මේ වන විට පළමු පන්තියේ නිදන කාමර පහසුකම් සැපයෙන්නේ නැති බව එතුමා දන්නේද;

(ii) එසේ නම්, මෙම පහසුකම නොමැති වීමට හේතු කවරේද;

(iii) එම පහසුකම යළි හඳුන්වා දෙනු ලබන්නේද;

(iv) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වෙනත් මාර්ගවල පළමු පන්තියේ (වායුසමන පහසුකම් සහිත) නිදන මැදිරියක් සඳහා ප්‍රවේශ පතක මිල රු. 2,800.00ක් ලෙස තිබියදී, කොළඹ-මඩකලපුව රාත්‍රී තැපැල් දුම්රියේ පළමු පන්තියේ (වායුසමනය නොකරන ලද) නිදන මැදිරියක් සඳහා ප්‍රවේශ පතක මිල රු. 5,000ක් වන බව එතුමා දන්නේද;

(ii) මෙම මිල වෙනසෙහි තාර්කික පදනම කුමක්ද;

(iii) මෙවන් පැහැදිලි ලෙසම වෙනස් කොට සැලකිලි දැක්වීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

923/2025

ගරු සුනිල් රත්නසිරි මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT) ආරම්භ කිරීම සඳහා එවකට වෙළෙඳ අමාත්‍යාංශය විසින් මුදල් යොදවා තිබේද;

(ii) එසේ නම්, එම මුදල කොපමණද;

(iii) මේ වනවිට එම ආයතනයේ ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iv) 2020 වර්ෂයේ සිට 2024 දක්වා එම ආයතනයේ ඉගෙනුම ලැබූ සිසුන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) මේ වනවිට එම ආයතනයේ බිඳවැටීමක් තිබේ නම්, එය වළක්වා ගැනීම සඳහා ගන්නා ලද පියවර කවරේද;

(vi) එම ආයතනය අලාභ ලබන තත්ත්වයට පත් කරන ලද කළමනාකාරිත්වයට එරෙහිව ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

953/2025

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ ප්‍රාදේශීය රෝහලක සිටිය යුතු සේවක සංඛ්‍යාව එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වවුනියාව, මන්නාරම සහ මුලතිව් දිස්ත්‍රික්කවල ඇති රජයේ ප්‍රාදේශීය රෝහල් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒවායේ නම් කවරේද;

(iv) ඉහත රෝහල්වල සේවය කිරීම සඳහා ස්ථිර පත්වීම් ලැබූ හෙදියන් මේ වනවිට එම රෝහල්වල සේවයේ යෙදී සිටින්නේද;

(v) නොඑසේ නම්, එයට හේතු කවරේද;

(vi) ඒ සඳහා ලබා දෙන විසඳුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ, පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය රෝහල, මූලික රෝහලක් ලෙස උත්ශ්‍රේණිගත කර තිබේද;

(ii) එසේ නම්, උත්ශ්‍රේණිගත කරනු ලැබූ දිනය කවරේද;

(iii) රෝහලේ වර්ගීකරණය අනුව එම රෝහලේ අනුමත සේවක සංඛ්‍යාව සහ මේ වනවිට සේවය කරනු ලබන සේවක සංඛ්‍යාව එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

973/2025

ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇලුමිනියම් කර්මාන්තකරුවන්ගේ අවශ්‍යතාවය සඳහා ප්‍රමාණවත් තරම් ඇලුමිනියම් රජය විසින් ලබා නොදීමට හේතු කවරේද;

(ii) ඇලුමිනියම්, ව්‍යාජ ලෙස අගය එකතු කරන ලද නිෂ්පාදන ලෙස අපනයනය කිරීමට එරෙහිව ගනු ලබන පියවර කවරේද;

(iii) ඇලුමිනියම් කර්මාන්තකරුවන් ආරක්ෂා කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

974/2025

ගරු එම්. එස්. උදුමාලෙබ්බෙ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ, සමන්තුරේ වාරිමාර්ග කාර්යාලය මඟින් නඩත්තු කරනු ලබන දකුණු ඉවුර ප්‍රධාන ඇළ මාර්ගයේ ඇති ‘තොප්පිකුඩා’ ප්‍රධාන ඇළ පිටාර ගලන කාලවලදී සමන්තුරේ සහ නින්දවූර් ප්‍රදේශවල කුඹුරු අක්කර දහස් ගණනක් වතුරට යට වන බව දන්නේද;

(ii) ඉහත ඇළ මාර්ගය ස්ථිර ලෙස ප්‍රතිසංස්කරණය කිරීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් වෙන් කර තිබේද;

(iii) එසේ නම්, එම මූල්‍ය ප්‍රතිපාදනය කොපමණද;

(iv) එම ඇළ මාර්ගය ප්‍රතිසංස්කරණ කටයුතු නිම කිරීමට අවශ්‍ය කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

979/2025

ගරු තිළිණ සමරකෝන් මහතා,— ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජයේ ‘සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන’ පිහිටුවීමේ වැඩසටහන යටතේ ආරම්භ කරන ලද ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැඩසටහන යටතේ ඉලක්ක කරන ලද ප්‍රතිලාභීන් සංඛ්‍යාව සහ මේ වනවිට සපුරාගෙන ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වනවිට ක්‍රියාත්මක තත්ත්වයේ පවතින ගම්මාන කවරේද;

(iv) එම වැඩසටහනේ අපේක්ෂිත අරමුණු ඉටු වී තිබේද;

(v) තවදුරටත් එම වැඩසටහන ක්‍රියාත්මක කරන්නේද;

(vi) එසේ නම්, එම වැඩසටහන සඳහා හඳුන්වා දෙන නව යෝජනා කවරේද;

(vii) එම යෝජනා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාල වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් වෙත ණය ලබා දී තිබේද;

(ii) එසේ නම්, ඔවුන්ට ලබා දී ඇති මුළු ණය මුදල කොපමණද;

(iii) මේ වනවිට එම ණය නැවත අය කර ගැනීමේ ප්‍රගතිය කවරේද;

(iv) මේ වනවිට නැවත අය කර ගෙන ඇති ණය මුදල සහ අය කර ගැනීමට ඉතිරිව ඇති ණය මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

පා. 3/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ජාතික ක්‍රීඩා කණ්ඩායමක් නියෝජනය කරනු ලබන හෝ ජාතික මට්ටමේ වාර්තාවකට හිමිකම් කියනු ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ ඕනෑම උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා අවකාශ සලසා දීම,— ශ්‍රී ලංකාවේ ඕනෑම ජාතික ක්‍රීඩා කණ්ඩායමක් නියෝජනය කරනු ලබන හෝ ජාතික මට්ටමේ වාර්තාවකට හිමිකම් කියනු ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ඔවුන්ගේ මූලික අධ්‍යාපන සුදුසුකම් හෝ Z- අගය මත පදනම් නොවී ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ ඕනෑම උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය නෛතික හා උසස් අධ්‍යාපනික ව්‍යුහය රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 4/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ශ්‍රී ලංකාවේ සියලුම අධ්‍යාපන විද්‍යා පීඨ විශ්වවිද්‍යාල පීඨ බවට පත් කිරීම,— ශ්‍රී ලංකාවේ අධ්‍යාපන මට්ටම දියුණු ජාත්‍යන්තර තලයට ගෙන යාම උදෙසා පාසැල් පද්ධතියේ සියලුම ගුරුවරුන් පුහුණු උපාධිධාරී ගුරුවරුන් බවට පත් කිරීමට අවශ්‍ය වන හෙයින් ද, වර්තමානයේ බහුතරයක් ගුරුවරුන් හට තෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පාඨමාලාවක් අවසානයේ උසස් ඩිප්ලෝමාවක් හිමිවන හෙයින් ද, වසර තුනක න්‍යායාත්මක පාඨමාලාවක් සහ එක්

වසරක පාසැල් කේන්ද්‍රීය පුහුණුවක් සහිත සිව් වසරක උපාධි පාඨමාලාවක් ප්‍රදානය කිරීම සඳහා උචිත වන සේ දැනට ක්‍රියාත්මක අධ්‍යාපන විද්‍යා පීඨ දහනවය විශ්වවිද්‍යාල පීඨ බවට පත් කිරීමට එවකට අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2020 පෙබරවාරි 13 දින ඉදිරිපත් කොට අනුමතිය ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණය බලාත්මක කිරීම සඳහා රජය විසින් අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 5/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— මී පැණි කර්මාන්තය වැඩිදියුණු කිරීම,— ඉතා ඉහළ ඖෂධීය ගුණයෙන් යුතු, දේශීය හා විදේශීය වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුමක් ඇති මී පැණි කර්මාන්තය, දේශීය වශයෙන් වැඩිදියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 6/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට වැඩිම ආදායමක් ලබා දෙන දුම්රිය මාර්ගයක් ලෙස කැලණිවැලි දුම්රිය මාර්ගය සලකනු ලබන හෙයින් ද, මෙම දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීම තුළින් එහි ප්‍රතිලාභ රත්නපුර, බදුල්ල සහ හම්බන්තොට ඇතුළු දිස්ත්‍රික්ක රැසක ජනතාවට භුක්ති විඳිය හැකි වන හෙයින් ද, කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 7/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— රුවන්පුර අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම,— රුවන්පුර අධිවේගී මාර්ගය ඉදිකිරීමේ ප්‍රතිලාභ රත්නපුර දිස්ත්‍රික්කයට පමණක් නොව බදුල්ල සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල ජනතාවට ද ලැබෙන හෙයින්, රටේ පවතින ආර්ථික දුෂ්කරතා හමුවේ වුව ද විශාල ප්‍රතිලාභ රැසක් ලබා ගැනීමට හැකියාව ඇති මෙම ව්‍යාපෘති අඛණ්ඩව කොටස් වශයෙන් හෝ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 8/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳව ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලංකාවේ ආහාර කලාව, රසකාරක හා සංයෝග කිරීමේ කලාව, ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු අංග ගණනාවකින් සමන්විත වන බැවින්, ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීමේ ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මඟින් දේශීය හා විදේශීය ජනතාව අතර අප රටේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීමට මෙන්ම ශ්‍රී ලාංකීය අනන්‍යතාවය ලෝකය තුළ ඔසවා තැබීමට සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 9/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— පාසල් දරුවන්ගේ වටිනාකම සමාජගත කිරීම,— පාසැල් දරුවන් නිරන්තරයෙන් ඇසුරු කරන දෙමාපියන්, ගුරුවරුන්, ක්‍රීඩා පුහුණුකරුවන්, පාසැල් වෑන් රථ රියැදුරන් ආදී පුද්ගලයන්හට දරුවන්ගේ වටිනාකම පිළිබඳ සමාජ විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක ක්‍රමවේද තුළින් සරලව පැහැදිලි කර රටේ හා සමාජයේ ඉදිරි යහපැවැත්ම වෙනුවෙන් දරුවන් සමාජ අභියෝග හමුවේ ආරක්ෂා කළ යුතු ආකාරය පිළිබඳ දැනුම්වත් කිරීමේ ජාතික මට්ටමේ වැඩසටහනක් රජය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 10/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— වතුකර ප්‍රදේශවල ක්‍රීඩා ක්ෂේත්‍රය දියුණු කිරීම,— වතුකර ප්‍රදේශවල ජීවත්වන තරුණ තරුණියන් ක්‍රීඩා ක්ෂේත්‍රයේ ජාතික හා ජාත්‍යන්තර මට්ටමෙන් තමන්ගේ හැකියාවන් ප්‍රදර්ශනය කර ඇති හෙයින් ද, ඔවුන් අධ්‍යාපනය හදාරන වතු පාසල්වල මෙන්ම ජීවත්වන වතු ප්‍රදේශවල ද ක්‍රීඩා ක්ෂේත්‍රය සඳහා කිසිදු පහසුකමක් නොමැති හෙයින් ද, රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම පිණිස වතුකර ප්‍රදේශවල තරුණ තරුණියන්ගේ දායකත්වය ලබා ගැනීම සඳහා ප්‍රදේශයට අදාළ ක්‍රීඩා සංවර්ධනය උදෙසා වැඩසටහනක් දියත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/2024

ගරු රෝහණ බංඩාර මහතා,— සමුපකාර ග්‍රාමීය බැංකු පද්ධතිය නිසි අධීක්ෂණයකට ලක් කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ජනතාවට ඉතාම සමීප සමුපකාර ග්‍රාමීය බැංකු රැසක් පසුගිය කාලයේ දී විවිධ හේතු මත බිඳ වැටීමෙන් එහි තැන්පත්කරුවන් විවිධ දුෂ්කරතාවලට මුහුණ දී සිටින හෙයින් මෙම තත්ත්වය වළක්වාලීම සඳහා එම බැංකු රජය විසින් නිසි අධීක්ෂණයකට ලක් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ශ්‍රී ලංකා විදේශ සේවයේ පත්වීම් ලබාදීම විධිමත් කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ජාත්‍යන්තර ප්‍රජාව ඉදිරියේ ඔසවා තබන විදේශ සේවය සඳහා සිදු කරන ලද දේශපාලන පත් කිරීම් හේතුවෙන් එම සේවයේ ගුණාත්මකභාවය බිඳ වැටී අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වී තිබෙන හෙයින් එම තත්ත්වය වළක්වාලීම සඳහා විදේශ සේවයට සිදු කරනු ලබන සියලුම පත් කිරීම් තරඟ විභාග ප්‍රතිඵල සහ කුසලතාවය මත සිදු කිරීමට රජය විසින් වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ලංගම ඩිපෝ සඳහා භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදයක් සකස් කිරීම,— ලංගම ඩිපෝ සඳහා භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදයක් නොමැති වීම, ලංකා ගමනාගමන මණ්ඩලයේ පවතින දූෂිත තත්ත්වයට ප්‍රධාන හේතුවක් වන හෙයින් මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා සුදුසු ප්‍රසම්පාදන ක්‍රමවේදයක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/2024

ගරු වමින්ද විජේසිරි මහතා,— වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය පිළිබඳව පාසල් සිසුන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික විශ්වවිද්‍යාල රාමුවෙන් බැහැරව, රැකියා වෙළඳපොළ හා වෘත්තීය තාක්ෂණය ඉලක්ක කොටගත් වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ පාඨමාලා පිළිබඳව පාසල් සිසුන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/2024

ගරු වමින්ද විජේසිරි මහතා,— පළාත් සභා සතු විෂයයන් විද්‍යානුකූල ක්‍රමවේදයකට සකස් කිරීම,— වර්තමානය වනවිට පළාත් සභා සතු විෂයයන් කිසිදු විද්‍යානුකූල පදනමක් නොමැති ආකාරයකට වෙන් කර තිබෙන හෙයින් ද, එමගින් විවිධ ගැටලු මතු වී තිබෙන හෙයින් ද, මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා එම විෂයයන් විද්‍යානුකූල පදනමක් මත නිසි ක්‍රමවේදයකට වෙන් කර දැක්වීමට සුදුසු වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/2024

ගරු වමින්ද විජේසිරි මහතා,— ලංකා ගමනාගමන මණ්ඩලය ශක්තිමත් කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ පොදු ප්‍රවාහන සේවාව ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය කරුණක් හෙයින්, ලංකා ගමනාගමන මණ්ඩලය විසින් භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේ දී සිදුවන වංචා හා දූෂණ වළක්වා ගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/2024

ගරු වමින්ද විජේසිරි මහතා,— කිරි නිෂ්පාදනය ඉහළ දැමීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— වාර්ෂිකව කිරි ආනයනය කිරීම සඳහා විශාල වශයෙන් විදේශ විනිමය මෙරටින් බැහැර වන හෙයින් මෙම තත්ත්වය වළක්වාලීම සඳහා ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනය ඉහළ දැමීමේ වැඩසටහනක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 23/2024

ගරු වමින්ද විජේසිරි මහතා,— ජාතික නිෂ්පාදනයට පශු සම්පත් ක්ෂේත්‍රයෙන් ලැබෙන දායකත්වය ඉහළ නැංවීම,— ශ්‍රී ලංකාවේ ජාතික නිෂ්පාදනයට පශු සම්පත් ක්ෂේත්‍රයෙන් ලැබෙන දායකත්වය ඉහළ දැමීම සඳහා වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 26/2024

ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ආයතන දේශපාලනීකරණයෙන් තොර කිරීම,— ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ආයතන දැඩි ලෙස දේශපාලනීකරණය වී ඇති බව පෙනී යන බැවින්, ඡන්දයෙන් තේරී පත් වන දේශපාලනඥයින් ක්‍රීඩා ආයතනවල නායකත්ව තනතුරු සඳහා තරග කිරීම සහ ඒවා හෙබවීම තහනම් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 27/2024

ගරු රවී කරුණානායක මහතා,— සෑම තරුණයෙකුම ඵලදායි රැකියාවක නියුතු පුද්ගලයෙකු හෝ ස්වයං රැකියාවක නියුතු ව්‍යවසායකයෙකු බවට පත් කිරීම,— වයස අවුරුදු 18 සම්පූර්ණ කරන සෑම තරුණයෙකුටම ඵලදායි රැකියාවක නියැලීමේ අයිතිය තිබිය යුතු අතර, රැකියාවක නිරත නොවන්නේ නම්, ස්වයං රැකියාවක නියුතු ව්‍යවසායකයෙකු බවට පත්වීම සඳහා මූල්‍ය ආධාර ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 30/2025

ගරු රවී කරුණානායක මහතා,— වාර්ගිකත්වය සහ ආගමික පදනම අනුව දේශපාලන පක්ෂ නම් කිරීම තහනම් කිරීම,— වාර්ගිකත්වය සහ ආගමික පදනම අනුව දේශපාලන පක්ෂ නම් කිරීම තහනම් කළ යුතු බවටත් ශ්‍රී ලංකාවේ දැනට උද්ගතව තිබෙන තත්ත්වය සැලකිල්ලට ගනිමින් වාර්ගික හෝ ආගමික පදනමක් දක්වන නම් දරන දැනට පවතින දේශපාලන පක්ෂ වලටද එවැනි වෙනසක් ක්‍රියාත්මක කළ යුතු බවටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 31/2025

ගරු රවී කරුණානායක මහතා,— උද්ධමනයට සාපේක්ෂව 1%ක ප්‍රතිලාභයක් සේවකයින්ට ගෙවීම,— රජයේ ආයතන විසින් පරිපාලනය කරනු ලබන සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල විසින් වාර්ෂික උද්ධමන අනුපාතයට වඩා අවම වශයෙන් 1%කින් ඉහළ ප්‍රතිලාභ සේවා නියුක්තිකයින්ට ලැබෙන බවට වගබලා ගත යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 32/2025

ගරු රවී කරුණානායක මහතා,— ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා නොමිලේ ගමන් පහසුකම් සැපයීම,— සියලුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා පොදු ප්‍රවාහන සේවා තුළ නොමිලේ ප්‍රවාහන පහසුකම් සැපයිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 33/2025

ගරු රවී කරුණානායක මහතා,— සංක්‍රමණික සේවකයින් විසින් මුහුණ දෙනු ලබන ගැටළු විසඳීම සඳහා නීතිමය බලතල සහිත ඒකකයක් පිහිටුවීම,— සංක්‍රමණික සේවකයින් විසින් මුහුණ දෙනු ලබන පහරදීම, පැහැර ගැනීම, ස්ත්‍රී දූෂණය, ලිංගික අපයෝජනය, මනුෂ්‍ය ඝාතනය හා මූල්‍ය වංචා ඇතුළු ගැටළු පිළිබඳව සොයා බැලීමට සහ බලපෑමට ලක් වූ සේවකයින්හට ශ්‍රී ලංකාවට ආරක්ෂිතව නැවත පැමිණීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමට සහ ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳව කටයුතු කිරීමට නීතිමය බලතල සහිත ඒකකයක් පිහිටුවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 34/2025

ගරු රවී කරුණානායක මහතා,— නව නිපැයුම්කරුවන් ලෝකයට හඳුන්වාදීම සඳහා ජාතික වැඩසටහනක් සකස් කිරීම,— විවිධ කුසලතාවලින් පිරිපුන් නව නිපැයුම්කරුවන් සහ පුරවැසියන් ලෝකයට හඳුන්වාදීම සඳහා සහ ඔවුන්ගේ කුසලතා සහ නිර්මාණ වැඩිදියුණු කිරීම සඳහා ජාතික වැඩසටහනක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 35/2025

ගරු රවී කරුණානායක මහතා,— දේශීය අමුද්‍රව්‍ය භාවිතා කරන කර්මාන්තකරුවන්ට බදු සහන,— ජාත්‍යන්තර වෙළඳපොළ සඳහා භාණ්ඩ නිෂ්පාදනය කිරීමේදී, 75% කට වඩා දේශීය අමුද්‍රව්‍ය භාවිතා කරන දේශීය කර්මාන්තකරුවන්ට, වසර දෙකක බදු සහනයක් ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 36/2025

ගරු රවී කරුණානායක මහතා,— ඡන්දය ප්‍රකාශ කිරීමට ඇති අයිතිය ලබා දීම,— ලියාපදිංචි ඡන්දදායකයින් වැඩි සංඛ්‍යාවකට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඇති අයිතිය අහිමි වී ඇති හෙයින් වඩාත් සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියක් නිර්මාණය කිරීම උදෙසා වයස අවුරුදු දහ අටට වැඩි සෑම පුද්ගලයෙකුටම ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීමටත්, ඡන්ද හිමි නාමලේඛනයේ නම සඳහන් වීමෙන් පසු යම් පුද්ගලයෙකු ඡන්දය ප්‍රකාශ නොකරන්නේ නම් ඔවුන්ට දඩ නියම කිරීමටත් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 39/2025

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— බිම් මට්ටමේ පවතින සියලුම පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් ඇති ජනතා අප්‍රසාදය වළක්වා ගැනීමට කටයුතු කිරීම,— ජනතාවට වඩාත්ම සමීපතම මහජන නියෝජිත ආයතනවන බිම් මට්ටමේ පවතින සියලුම පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් බොහෝවිට ජනතාව තුළ ඉතාමත් අසතුටුදායක හැඟීමක් පවතින හෙයින් එම ආයතන පිළිබඳ වැඩි අවධානයක් ලබා දීමට රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 40/2025

ගරු ටී. කේ. ජයසුන්දර මහතා,— පිටිගල, උඩුගම, නෙලුව සහ දෙණියාය නගර අයත් පරිසර පද්ධතිය සංචාරක කලාපයක් ලෙස නම් කිරීම,— ශ්‍රී ලංකාව නව පුනරුදයකට අවතීර්ණ වී ඇති අවස්ථාවක රටේ සංචාරක ව්‍යාපාරය දේශීය ආදායම ඉහළ නැංවීමට හේතු වන හෙයින්ද, ශ්‍රී ලංකාවේ පහතරට වැසි වනාන්තර අතරින් ලෝක උරුමයක් වන සිංහරාජ වනාන්තරයද, විශේෂිත සත්ත්ව හා ශාක විශේෂවලින් ගහන වූ කන්නෙලිය වනාන්තරය සහ හිනිදුම කන්ද ඇතුළත් කඳුවැටියේ (හේකොක්) ජෛව පද්ධතිය විදේශීය ජනතාවගේ විශේෂ අවධානය දිනාගත් පරිසර පද්ධතියක් වන හෙයින්ද, මෙම පරිසර පද්ධතිය ඇතුළත් පිටිගල, උඩුගම, නෙලුව සහ දෙනියාය නගර අයත් පරිසර පද්ධතිය සංචාරක කලාපයක් ලෙස නම් කර එය සංවර්ධනය කිරීම සඳහා රජය විසින් අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 41/2025

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ව්‍යවස්ථාව ඇතුළු සංයුතිය වෙනස් කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— වර්තමානය වනවිට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සම්බන්ධව සමාජයේ විශාල කථිකාවක් නිර්මාණය වී තිබෙන හෙයින්ද, එහි නිලවරණයේ දී එක්තරා සමිති කණ්ඩායමක් සතුව ක්‍රිකට් ආයතනයේ බලය පැවතීම හේතුවෙන් අක්‍රමිකතා බහුලව සිදුවන ආයතනයක් බවට පත්වී ඇති හෙයින් එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා ක්‍රිකට් ආයතනයේ ව්‍යවස්ථාව ඇතුළු සංයුතිය සංශෝධනය කිරීමට රජය විසින් අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 42/2025

ගරු රුවන් මාපලගම මහතා,— පාසැල් විෂය මාලාවට නීතිය සහ ආචාර ධර්ම ඇතුළත් කිරීම,— මෙරට පොදු ජනතාව මුහුණ දෙන එදිනෙදා ගැටලුවලට ප්‍රධාන හේතුවක් ලෙස එදිනෙදා ජීවිතයට අවශ්‍ය මූලික නීතිය පිළිබඳ නොදැනුවත්කම හඳුනාගෙන ඇති හෙයින් ද, නීතිය නොදැන සිටීම නීතිය ඉදිරියේදී නිදහසට කරුණක් නොවන හෙයින්ද, පාසැල් විෂය මාලාව සංකීර්ණ වීම වළක්වා ගනිමින් 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා පාසැල් දරුවන්ගේ පුරවැසි අධ්‍යාපනය විෂය නිර්දේශයට රටේ මූලික නීතිය පිළිබඳ ඉගැන්වීම් ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 43/2025

ගරු රෝහණ බංඩාර මහතා,— මහාචාර්ය, ආචාර්ය තනතුරු අවභාවිත කිරීම වළක්වා ගැනීමට වැඩපිළිවෙළක් සකස් කිරීම,— වර්තමානයේ අප සමාජයේ බොහෝ පිරිස් මහාචාර්ය, ආචාර්ය වැනි තනතුරු හා නාමයන් අවභාවිත කරන හෙයින් එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා වැඩසටහනක් සකස් කිරීමට රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 44/2025

ගරු චමින්ද විජේසිරි මහතා,— ශ්‍රී ලංකා වරාය අධිකාරිය සම්බන්ධයෙන් 2023 වර්ෂයේ විගණන වාර්තාවේ දැක්වෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම,— ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ හදවත බඳු ශ්‍රී ලංකා වරාය අධිකාරිය සම්බන්ධයෙන් ඉතා වැදගත් නිර්දේශ ජාතික විගණන වාර්තාවේ දක්වා ඇති හෙයින් එම නිර්දේශ ක්‍රියාවට නැංවීමට විධිමත් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 45/2025

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් පාලන ආයතනවල මුදල් නිසි ලෙස මහජන සේවා සඳහා යෙදවීම,— වර්තමානය වනවිට බොහෝ පළාත් පාලන ආයතන සිය මුදල් නිසි ලෙස මහජන, සෞඛ්‍ය පොදු සේවා සහ පොදු මාවත් දියුණු කිරීම වැනි කටයුතු සඳහා නොයොදවා ලාභ ඉපැයීමේ අරමුණින් ස්ථාවර තැන්පතුවල තැන්පත් කොට ඇති බවට කරුණු අනාවරණය වී ඇති හෙයින් එම තත්ත්වය වළක්වා ගැනීමට රජය විසින් සුදුසු වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 46/2025

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය පිහිටුවා මේ වන විට වසර 35ක් පමණ ගතවී ඇති හෙයින්ද, එම පරීක්ෂණාගාරය මේ වන විට නිසි පරිදි ක්‍රියාත්මක නොවන හෙයින්ද, එබැවින් ආනයනික ඖෂධ වැඩි ප්‍රමාණයක් නිසි තත්ත්ව පරීක්ෂාවකට ලක් නොවන හෙයින්, එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා නිසි වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 47/2025

ගරු රෝහණ බංඩාර මහතා,— ගොවි ජනතාව වෙනුවෙන් රක්ෂණ ක්‍රමයක් ආරම්භ කිරීම,— රටක ගොවි ජනතාවගේ සුභසාධනය සැලසීම රජයක වගකීම වන හෙයින්, මෙරට ජනයාගෙන් බහුතරයක් වන ගොවි ජනතාව වෙනුවෙන් රක්ෂණ ක්‍රමයක් ඇති කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 48/2025

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— ඛනිජ තෙල්, ඉන්ධන හා ජලය පිළිබඳ කර්මාන්ත ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ නියාමනයට යටත් කිරීම,— විදුලිය, ඛනිජ තෙල්, ඉන්ධන හා ජලය පිළිබඳ කර්මාන්ත නියාමනය කළ යුතු වුවත්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය අධීක්ෂණය කිරීම සඳහා අදාල පනත් සංශෝධනය නොකිරීම හේතුවෙන් වසර 21කට වැඩි කාලයක සිට ඛනිජ තෙල් සහ ජලය යන කර්මාන්ත නියාමනයට යටත් නොවී තිබෙන තත්ත්වය වෙනස් කිරීම සඳහා අදාල නීතිමය කටයුතු සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 49/2025

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— ඉන්ධන පිරවුම්හල් සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රියාදාමය නියාමනය කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ ඉන්ධන පිරවුම්හල් බලපත්‍ර ලබාදීමේ ක්‍රියාදාමය දැඩි අවිධිමත් තත්ත්වයක පවතින බැවින්, එම තත්ත්වය විධිමත් කිරීම සඳහා නියාමන වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 50/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— ෆයිනස් වගාවන් හේතුවෙන් ජල මූලාශවලට සහ පරිසරයට සිදුවන හානිය වැළැක්වීමට ක්‍රමවේදයක් සකස් කිරීම,— විශේෂයෙන්ම ඌව පළාත ඇතුළුව කඳුකර ප්‍රදේශවල වගා කර ඇති ෆයිනස් වගාවන් හේතුවෙන් ජල මූලාශවලට සහ පරිසරයට සිදුවන හානිය පිළිබඳව සලකා බලා ඒවා ඉවත් කර ප්‍රයෝජනවත් දේශීය වගාවන් සිදු කිරීමට ක්‍රමවේදයක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 51/2025

ගරු රවී කරුණානායක මහතා,— ජාතික භාෂා පීඨයක් පිහිටුවීම,— ගුරුවරුන් සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා උගන්වනු පිණිස ජාතික භාෂා පීඨයක් පිහිටුවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 52/2025

ගරු චමින්ද විජේසිරි මහතා,— ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබාගත් ණය වින්දිතයින් බවට පත් වූ පුද්ගලයින්හට සාධාරණය ඉටු කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබාගත් පිරිසෙන් අති බහුතරයක් මේ වනවිට ණය වින්දිතයින් බවට පත්ව සිටින බැවින්, එම පිරිසට සාධාරණය ඉටු කිරීම සඳහා වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 53/2025

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ටෙලි නාට්‍ය කර්මාන්තය දියුණු කිරීම සඳහා සහ එම කර්මාන්තය නියාමනය කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ජනතාවට විනෝදාස්වාදය සපයන ප්‍රධාන කර්මාන්තයක් වන ටෙලි නාට්‍ය කර්මාන්තය දියුණු කිරීම සඳහා සහ එම කර්මාන්තය නියාමනය කිරීම සඳහා යම් නියාමන ආයතනයක් ස්ථාපිත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 54/2025

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— පළාත් පාලන ආයතන තුළ මහා පරිමාණයෙන් මහජන මුදල් අවභාවිතා කළ තැනැත්තන්ට එරෙහිව පියවර ගැනීම,— ශ්‍රී ලංකාව පුරා පිහිටි සියලුම පළාත් පාලන ආයතනයන්හි පසුගිය කාලය තුළ මහා පරිමාණයෙන් මහජන මුදල් අවභාවිතා වීම සම්බන්ධව කඩිනමින් පරීක්ෂණ පවත්වා ඒ සඳහා දායක වූ සියලුම බලධාරින්ට පවත්නා නීතිය අනුව දඬුවම් ලබා දීමට කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.